# අපි
# 20 වන ආණ්ඩුක්‍රම සංශෝධනය
# පිළිබඳ ව සිතා බලමු

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බොහෝ වෙනස්කම් යෝජනා කරනු ලැබ තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැදගත් වන්නේ නීතිඥයින්ට සහ දේශපාලඥයින්ට පමණක් යැයි බොහෝ දෙනා සිතති - නමුත් එය එසේ නොවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔබේ අයිතිවාසිකම්, ඔබේ ආරක්ෂාව, ඔබේ ජීවනෝපාය සහ ඔබේ ජීවිතයට බලපායි.

ඔහු හෝ ඇය තෝරාපත් කර පාර්ලිමේන්තුවට යැවුවේ ඔබ වන බව ඔබේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට අමතක කරන්නට ඉඩ නොදෙන්න.

ඔබේ මනාපයෙන් පාර්ලිමේන්තුවට ගොස්, ඔබේ යහපතට විරුද්ධ දේවල් සඳහා ඡන්දය ලබාදීමට ඔබේ නියෝජිතයාට නොහැකි ය.

## 20A සම්මත වුවහොත් ශ්‍රී ලංකාව පාලනය වනු ඇති අන්දම දෙස මදක් බලමු:

## 1. ජනාධිපතිවරයාට අසීමිත බලතල හිමිවනු ඇත

- **20A යටතේ ජනාධිපතිවරයාට එරෙහි ව නඩුපැවරිය නොහැකි ය**

තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා ජනාධිපතිවරයාට එරෙහි ව මූලික අයිතිවාසිකම් අයදුම් ගොනු කිරීමට පුරවැසියන්ට නොහැකි වනු ඇත - ජනාධිපතිවරයා සිටිනු ඇත්තේ නීතියට ඉහළිනි.

මෑතක දී, බ්‍රසීලයේ සහ පේරු රාජ්‍යයේ ජනාධිපතිවරුන් සහ මැලේසියාවේ අගමැතිවරයා දූෂණ ක්‍රියා සහ මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් චෝදනා ලැබූහ. මෙය, තමන්ගේ බලය අයුතු ලෙස යොදාගැනීමෙන් සහ නීතිය උල්ලංඝනය කිරීමෙන් වැලකීම සඳහා අනාගත ජනාධිපතිවරුන්ට ලබාදුන් අනතුරු ඇඟවීමක් විය යුතු ය. එහෙත් ශ්‍රී ලංකාවේ මෙසේ කළ නොහැකිවනු ඇත.

ජනාධිපතිවරයා කිසිවකට - අපරාධ ක්‍රියාවලට පවා - වගවීමෙන් නිදහස් වේ.

- **20A යටතේ ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට හෝ සහජීවනය දිරිගැන්වීමට හෝ තවදුරටත් වගකිව යුතු නැත**

  අපේ ජනාධිපතිවරයාගේ මූලික වගකීම විය යුත්තේ ජනතාව සමගි කර සියලු ශ්‍රී ලාංකිකයින් එකමුතු කිරීම නොවේ ද?

- **20A යටතේ ජනාධිපතිවරයා, කැබිනට් මණ්ඩලය සම්පූර්ණයෙන්ම තම ආධිපත්‍යට නතු කරගනියි**

  අමාත්‍යවරුන් සංඛ්‍යාව තීරණය කිරීම, අමාත්‍යාංශ වෙන්කර දීම සහ සියලුම අමාත්‍යවරුන් තෝරාගැනීම සිදුවන්නේ ජනාධිපතිවරයා අතිනි. ඊට, කැබිනට් අමාත්‍යවරු, අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සහ වැඩබලන අමාත්‍යවරු ඇතුළත් වන අතර තමන් කැමති වේලාවක ඔවුන් ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකි ය.

  ජනාධිපතිවරයාට තමන් කැමති ඕනෑ ම අමාත්‍යාංශයක් සහ තමන් ට අවශ්‍ය කරන ඕනෑ ම අමාත්‍යාංශ සංඛ්‍යාවක් තමන් යටතට ගැනීමට හැකි ය.

  තනි පුද්ගලයකු වශයෙන් ජනාධිපතිවරයකුට පරිසරය, ඉඩම්, කම්කරු, වෙළෙඳ යනා දී විෂයයන්ට අදාළ සියලු ගැටළු ආමන්ත්‍රණය කළ හැකි ද?

  තනි මධ්‍යම බලධාරියකු විසින් තමන්ගේ යහපත ආරක්ෂා කරදෙනු ඇතැයි සියලුම පුරවැසියන්ට නිසැකයෙන් ම විශ්වාසය තැබිය හැකි ද?

  20 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම "ජනාධිපතිවරයා වන මම" පිළිබඳවයි - "ජනතාව වන අප" හට කුමක් සිදුවන්නේ ද?

## 2. ජම්බෝ කැබිනට් මණ්ඩලය නොහොත් අතිවිශාල කැබිනට් මණ්ඩලය ආපසු පැමිණීම

ජනගහණය බිලියනයක් සිටින ඉන්දියාවේ කැබිනට් මණ්ඩලයටත් වඩා විශාල කැබිනට් මණ්ඩලයක් පැවතීම හේතුවෙන් ලෝකයේ විශාල ත ම කැබිනට් මණ්ඩලය සඳහා වාර්තාව ශ්‍රී ලංකාවට හිමි ය.

2005 දී ශ්‍රී ලංකාවට කැබිනට් අමාත්‍යවරුන් 52 ක් සිටි අතර 2007 දී කැබිනට්-නොවන අමාත්‍යවරු 33ක් සහ නියෝජ්‍ය අමාත්‍යවරු 19ක් පත්කරන ලදී.

225ක් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් 104 දෙනෙකුට ම කවර හෝ අමාත්‍ය ධුරයක් හිමි වී තිබුණි.

20A යටතේ ජනාධිපතිවරයාට කැමතිනම්, විශාලතම කැබිනට් මණ්ඩලය සම්බන්ධයෙන් තැබූ වාර්තාව බිඳ හෙලමින් ඊටත් විශාල කැබිනට්ටුවක් පත් කරගැනීමට හැකි ය.

- **ජම්බෝ කැබිනට් මණ්ඩලයක් සඳහා ඇති අවශ්‍යතාවය කුමක් ද?**

  මෙහි අරමුණ වන්නේ වැඩි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ප්‍රමාණයකට විවිධ වරප්‍රසාද හා පහසුකම් ලබාදෙමින් ඔවුන්ගේ පක්ෂපාතිකම තමන් වෙත පවත්වාගෙන යාමයි.

  ඉතින්, ජනතාව වන අප, ඒ සඳහා ගෙවිය යුතු වේ - එවිට පාසල්, රෝහල් සහ සාමාන්‍ය ජනතාවගේ ජීවිතය වඩාත් යහපත් තත්වයකට ගෙන එන අනෙකුත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා ඉතිරි වන මුදල් ප්‍රමාණය අඩුවනු ඇත.

  රටවැසියන් ට අවශ්‍ය වන්නේ මෙය ද?

## 3. ජනාධිපතිවරයා අගමැතිවරයා සහ පාර්ලිමේන්තුව තමන්ගේ ආධිපත්‍යයට නතුකර ගනියි

ජනාධිපතිවරයා තෝරාපත් කරගන්නේ ජනතාව විසින් ය.

අගමැතිවරයා යනු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන අතර, අගමැති ඇතුළු සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාපත් කරගන්නේ ද ජනතාව විසින් ය.

පාර්ලිමේන්තුවක් තෝරා පත්කරගැනීම ද, ජනතාවගේ පරමාධිපත්‍යය ප්‍රකාශනය කිරීමක් වේ.

එය එසේ වුවත්,

- **20A යටතේ ජනාධිපතිවරයාට අගමැතිවරයා හා පාර්ලිමේන්තුව නොසලකා හැර පාර්ලිමේන්තුව විසිරුවා හැර අලුත් මැතිවරණයක් කැඳවිය හැකි ය.**

  අගමැතිවරයාට පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබුණ ද මහමැතිවරණයකින් වර්ෂයකට පසුව ජනාධිපතිවරයාට අවශ්‍ය ඕනෑ ම විටක පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි ය.

- **20A යටතේ කැබිනට් මණ්ඩලය සම්බන්ධ කරුණුවල දී අගමැතිවරයාට තීරණාත්මක හඬක් නොමැති වනු ඇත**

  ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාගේ අදහස් විමසනු ඇත්තේ එසේ කිරීම අවශ්‍ය යැයි සිතුවහොත් පමණය.

  ජනාධිපතිවරයා අගමැතිවරයාගේ උපදෙස් අනුගමනය කරන්නට අවශ්‍ය නොවේ.

- **20A යටතේ, පාර්ලිමේන්තුව නොවිසුරුවා ම, අගමැතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකි ය.**

  සිටින අගමැතිවරයා වෙනුවට, ජනාධිපතිවරයාගේ මතයේ හැටියට පාර්ලිමේන්තුවේ වැඩි ම විශ්වාසයක් ඇතැයි සිතන වෙනත් අයෙකු අගමැති වශයෙන් පත් කිරීමට ජනාධිපතිවරයට බලය හිමි වේ.

  අගමැති ධුරයේ බලතල තමන් වෙත පවරාගැනීමට ද ජනාධිපතිවරයාට හැකියාව ඇත.

- **20A යටතේ ජනාධිපතිවරයාට අගමැතිවරයා නොසලකා සිටිය හැකි ය.**

  අගමැතිවරයාට හිමිවනු ඇත්තේ සීමිත බලතල ප්‍රමාණයකි. - එසේ නම්, එම ධුරයෙන් ඇති ඵලය කුමක් ද?

පාර්ලිමේන්තුවේ සරළ බහුතරයකින් සම්මත වන යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව විසිරුවා හරින මෙන් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

මේවා, ජනතාව විසින් තෝරා පත්කරන ලද ආයතනයක් වන පාර්ලිමේන්තුවේ බලය යටපත් කිරීම සඳහා යොදන ක්‍රමය වේ.

## පාර්ලිමේන්තුව ඉවත්කර දැමීමට අප සූදානම් ද යන්න ජනතාව වන අප විසින් ප්‍රශ්න කළ යුතු වේ:

ශ්‍රී ලංකාවාසින් ඡන්දය ලබාදීම 1935 දී ආරම්භ කළ අතර 1948 පටන් ම අප පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් ලෙස පැවත තිබේ.

අපි පාර්ලිමේන්තු මැතිවරණ බරපතල කාරණාවක් ලෙස සලකන්නෙමු.

Covid-19 වසංගතය නොතකා 2020 දී ජනතාවගෙන් 70% ක් ඡන්දපොළ කරා ගොස් තම ඡන්දය ප්‍රකාශ කළහ.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසිරවීමට තීරණය කරන වාරයක් වාරයක් පාසා නව මැතිවරණ පැවැත්වීම ශ්‍රී ලංකාවට දැරිය හැකි වේ ද?

නිතර නිතර පවත්වන මැතිවරණ හරහා ඇතිවන අස්ථාවරත්වය හා දරන්නට වන පිරිවැය සම්බන්ධයෙන් කටයුතු කරන්නට ශ්‍රී ලංකාවට හැකි වේ ද?

පාර්ලිමේන්තුව නැතිකර දැමීමට පුරවැසියන් සූදානම් ද?

# 4. පුරවැසියන් නීති සම්පාදන ක්‍රියාවලියෙන් බැහැර කෙරේ

ක්‍රියාකාරී ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ, නීති සම්පාදනය සඳහා අදහස් යෙදවීමට මහජනතාවට අවස්ථාව තිබිය යුතු ය.

ඔවුන් පනත් කෙටුම්පත් අධ්‍යයනය කළ යුතුය, ඒවා සාකච්ඡා කර, මාධ්‍ය හා තම නියෝජිතයින් මගින් පාර්ලිමේන්තුවට නිර්දේශ ලබාදිය යුතු ය.

- **20A යටතේ පනත් කෙටුම්පතක් අධ්‍යයනය කර එය අභියෝගයට ලක් කිරීම සඳහා ජනතාවට ලැබෙන්නේ දින 7ක් පමණි.**

  ජනාධිපතිවරයා එය 'ජාතික අවශ්‍යතා සඳහා වන හදිසි පනත් කෙටුම්පතක්' ලෙස වර්ග කර එය කෙලින් ම ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන්නේ නම්, එහි ව්‍යවස්ථානුකූලභාවය තීරණය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට පැය 24 ක් හෝ පැය 72 ක් තිබේ.

  පනත් කෙටුම්පත පැය 24 ක් හෝ පැය 72 කින් සමාලෝචනය කළ යුතුද හෝ කළ හැකි ද යන්න තීරණය කරන්නේ ජනාධිපතිවරයා මිස අධිකරණය නොවේ.මෙම කෙටි කාල රාමුව පනත් කෙටුම්පතක් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියෙන් පුරවැසියන් ඉවත් කරයි.

**දුර්වල ලෙස නීති කෙටුම්පත් කරන ලද බොහෝ අවස්ථාවන්ට ශ්‍රී ලංකාව මුහුණ දී තිබේ - මෙම කඩිනම් ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය දිග ට ම කරගෙන යාමට පුරවැසියන් ට අවශ්‍ය ද?**

## 5. ස්වාධීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කොමිෂන් සභා මත ඇති කෙරෙන බලපෑම

දේශපාලනික ව නිලධාරීන් ප්‍රධාන තනතුරු සඳහා තෝරා ගැනීම රාජ්‍ය නිලධාරීන් මධ්‍යස්ථ හා අපක්ෂපාතී වනු ඇතැයි යන ජනතා විශ්වාසය නැතිකර දමයි.

ප්‍රධාන තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීමේ දී ජනාධිපතිවරයා වෙත නිර්දේශ ලබාදෙනු පිණිස 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින්, දේශපාලනික වශයෙන් සියලු පාර්ශව ඇතුළත් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය හඳුන්වා දෙන ලදී.

මෙම ප්‍රධාන පත්වීම් අතර ට ස්වාධීන ව්‍යවස්ථා කොමිෂන් සභා 9 ක් සහ ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්, නීතිපති, විගණකාධිපති, පොලිස්පති, ඔම්බුඩ්ස්මන් සහ පාර්ලිමේන්තු මහලේකම් ඇතුළත් විය. මෙම නිලධාරීන් ඉවත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ අනුමැතිය ද අවශ්‍ය වේ.

ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ගොඩනගා ඇති සංවරණ හා තුලනයන් මේවා ය.

- **20A යටතේ, කීර්තිමත් පුද්ගලයින් 3 දෙනෙකු ඇතුළත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පත් කරනු ලැබේ**

  පාර්ලිමේන්තු කවුන්සිලය යනු පක්ෂ මත පදනම් ව කටයුතු කරන දේශපාලන ආයතනයකි.

  පත්වීම් පිළිබඳ නිරීක්ෂණ ලබාදීම ඊට කළ හැකි නමුත් එම නිරීක්ෂණ අනුග මනය කිරීමට බැඳීමක් ඇති නොකරයි.

  එයට බලයක් නොමැති අතර ස්වාධීන විය නොහැක. ස්වාධීන හා අපක්ෂපාතී තීරණ ගත නොහැක - එසේනම්, ඉන් ඇති ඵලය කුමක් ද?

- **20A යටතේ මැතිවරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහ බලතල කෙරෙහි බලපෑම් ඇතිවේ**

  මැතිවරණ කොමිසම, එම කොමිසමේ සභාපති සහ ඕනෑ ම තාවකාලික සාමාජිකයකු පත් කරනු ඇත්තේ ජනාධිපතිවරයා විසින්, තනි ව ම වේ.

  මෑතකාලීන ව මැතිවරණ කොමිසමෙන් මාධ්‍ය වෙත නිකුත් කලාක් මෙන් මැතිවරණ සමයක රාජ්‍ය සේවය විසින් අනුගමනය කළයුතු මාර්ගෝපදේශ නිකුත් කිරීමෙන් වැලකී සිටින්නට මැතිවරණ කොමිසම කටයුතු කරන්නට ඉඩ තිබේ.

  මැතිවරණ කොමිසමෙන් නිකුත් කරන මාර්ගෝපදේශ හෝ උපදෙස් පොදුවේ පිළිපැදීමෙන් වැලකී සිටීම තවදුරටත් වරදක් වශයෙන් නොසලකනු ඇත.

**රාජ්‍ය සේවයේ චර්යාව සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීමට නොහැකි නම් සහ අනුකූලතාව නොදැක්වීම සඳහා දඬුවම් නොමැත්තේ නම්, මැතිවරණ නිදහසේ, සාධාරණ ව හා විනිවිදභාවයෙන් යුතු ව පවත්වන බවක් සහතික කරගැනීමට මැතිවරණ කොමිසමට හැකි වේ ද?**

**නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිසමට ඇති බලතලවලට මෙය බලපානු ඇති අන්දම පිළිබඳ ඔබ සැලකිලිමත් ද?**

- **20A යටතේ ජාතික පොලිස් කොමිසමේ ස්වාධීනත්වය සහ බලතල කෙරෙහි බලපෑම් ඇති වේ.**

  ජාතික පොලිස් කොමිසමට සාමාජිකයින් පත් කිරීමේ සහ ඉන් සාමාජිකයින් ඉවත්කිරීමේ බලය ජනාධිපතිවරයාට පමණක් හිමි වේ.

  පොලිස්පතිවරයා තවදුරටත් කොමිසමේ රැස්වීම්වලට සහභාගි නොවනු ඇත.

  කොමිසමේ තීරණ සම්බන්ධයෙන් ජනතාවට අභියාචනා කළ නොහැක.

  පොලිස් නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හෝ විනය ක්‍රියාමාර්ගවලට නතු කිරීමට ජාතික පොලිස් කොමිසමට බලතල නොමැති වනු ඇත.

  කොමිසමට කළ හැක්කේ මහජනතාව විසින් පොලීසියට එරෙහි ව කරන පැමිණිලි විමර්ශනය කිරීම පමණක් වන අතර, එය ද කළ හැක්කේ පාර්ලිමේන්තුවෙන් කෙටුම්පත් කරන නීතිවලට අනුව ය.

- **20A යටතේ අධිකරණ සේවා කොමිසමේ ස්වාධීනත්වය සහ බලතල කෙරෙහි බලපෑම් ඇති වේ.**

  අධිකරණ සේවා කොමිසමේ භූමිකාව වන්නේ දිස්ත්‍රික් විනිසුරන් හා මහේස්ත්‍රාත්වරුන් වැනි අධිකරණ නිලධාරීන්ගේ පත්වීම්, මාරුවීම්, සේවයෙන් පහ කිරීම් හා විනය පාලනය සහ උපලේඛනගත රාජ්‍ය නිලධාරීන් පත් කිරීම වේ.

  එබැවින් එය, අධිකරණයේ තීන්දුවල අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාමට උපකාරී වන අතර, විධායකයේ පාලනයෙන් මිදීමට හේතු වේ.

ජනාධිපතිවරයාට ඕනෑ ම විනිසුරුවරුන් දෙදෙනෙකු අධිකරණ සේවා කොමිසමට පත් කළ හැකි ය. ඔවුන් ජ්‍යෙෂ්ඨ විනිසුරන් වීම හෝ ප්‍රථම අවස්ථා උසාවියක (එනම්, ප්‍රාථමික අධිකරණයක හෝ මහේස්ත්‍රාත් අධිකරණයක) විනිසුරකු වශයෙන් සේවය කිරීමේ කිසිදු අත්දැකීමක් තිබීම අවශ්‍ය නොවේ.

පාර්ලිමේන්තු මණ්ඩලයට කිසිදු යොමුකිරීමකින් තොර ව එම සාමාජිකයින් පත්කිරීමට හෝ ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකි ය.

අධිකරණ සේවා කොමිසමට සාමාජිකයින් පත් කිරීම සඳහා නිර්ණායක නියම කොට නොමැත- උදා: වයස, සුදුසුකම්, අත්දැකීම්, ජ්‍යෙෂ්ඨත්වය යනාදිය.

මෙම පත්කිරීම් හා ඉවත්කිරීම් සම්බන්ධයෙන් නිරීක්ෂණයක් හෝ ලබාදීමට පාර්ලිමේන්තු මණ්ඩලයට අවස්ථාව නොමැත.

**අධිකරණ සේවා කොමිසම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට හිමිවන නිර්බාධිත බලතල මගින් ජනාධිපතිවරයාට අධිකරණය සම්බන්ධයෙන් නිර්බාධිත බලතල ලබාදෙයි.**

**එවිට රටවැසියන් නීතියේ ආධිපත්‍ය හරහා ආරක්ෂා වේ ද?**

- **20A යටතේ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ස්වාධීනත්වය සහ බලතල කෙරෙහි බලපෑම් ඇති වේ.**

20වැනි සංශෝධනයෙන් අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබුණු පිළිගැනීම ඉවත් කෙරෙන බැවින් ඉදිරි පාර්ලිමේන්තුවක් විසින් මෙම කොමිෂන් සභාව සම්පූර්ණයෙන් ම අහෝසි කිරීමට ඉඩ සලසනු ලැබේ.

අඩු ම දූෂණ ක්‍රියා අනුව ලෝකයේ රටවල් 180 ක් පෙළගස්වන ලද කළ ශ්‍රී ලංකාව ගන්නේ 93 වැනි ස්ථානයයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටෙර්නැෂනල් සංවිධානයේ 2019 දූෂණය පිළිබඳ අනුබෝධ දර්ශකයට අනුව රටවල් 180 ක් අතරින් ශ්‍රී ලංකාව 93 වැනි තැනට ශ්‍රේණිගත වී තිබේ.

රටේ ආර්ථිකය, සේවාවන්ගේ ගුණාත්මකබව, දේශපාලන ආයතන සහ සමාජ්‍ය ව්‍යුහයන් විනාශයට පත් කරන අල්ලස් හා දූෂණ සඳහා විරෝධය පෑමට පුරවැසියන් වශයෙන් අපට වුවමනා නොවේ ද?

එවැනි ක්‍රියා සිදු නොවන බව සහතික කරගැනීමටත් එසේ සිදුවන කළ ඒවා හඳුනාගැනීමටත් අපට ආයතනයක් අවශ්‍ය නොවන්නේ ද?

- **20A යටතේ ජාතික ප්‍රසම්පාදන කොමිසම සහ විගණන සේවා කොමිසම අහෝසි කෙරේ**

නියාමනය නොකළ සහ විනිවිදභාවයෙන් තොර ප්‍රසම්පාදන (ටෙන්ඩර්) ක්‍රියාවලියක් ශ්‍රී ලංකාවේ ඇතිවනු ඇති අතර තවත් දූෂණ ක්‍රියා සඳහා මෙයින් දොරටු විවෘත කරනු ඇත.

ස්වාධීන විගණන කොමිසමක් නොමැති කල නාස්තිය, වංචාව සහ මුදල් විශුද්ධිකරණය හඳුනාගැනීමට හෝ ඒවා පිළිබඳ මහජනයාට හෙළිදරවු කිරීමට නොහැකි වනු ඇති අතර, එමගින්, එවැනි ක්‍රියා සඳහා දඬුවම් කිරීමට නොහැකිවනු ඇත.

මුදල් විශුද්ධිකරණය සඳහා තෝතැන්නක් ලෙස ශ්‍රී ලංකාව අවධානම් සහගත රටවල් ලැයිස්තුවේ සිටින අතර මෙය විදේශ ආයෝජන සඳහා කිසිසේත් හිතකර තත්වයක් නොවේ. සැකසහිත ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාව ජාත්‍යන්තර පරීක්ෂාවට ලක් වනු ඇත.

- **20A යටතේ රාජ්‍ය සේවා කොමිසමේ ස්වාධීනත්වය සහ බලතල කෙරෙහි බලපෑම් ඇති වේ.**

රාජ්‍ය සේවා කොමිසම රජයේ නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් මෙන් ම රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නීති, රෙගුලාසි හා කාර්ය පටිපාටි සම්පාදනය සඳහා බලතල ඇති කොමිසමයි.

විසිවන ආණ්ඩුක්‍රම සංශෝධනය හේතුවෙන් පාර්ලිමේන්තු මණ්ඩලයේ අනුමැතියකින් තොරව ජනාධිපතිවරයා විසින් රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයින් පත් කරනු හා ඉවත් කරනු ඇත.

මෙම රාජ්‍ය සේවා කොමිසමට එහි සාමාජිකයින් නොවන තිදෙනෙකුගෙන් සමන්විත උප කමිටුවක් පත් කර රාජ්‍ය සේවයේ යම් යම් කාණ්ඩවලට අයත් නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම සඳහා බලතල එම උපකමිටුවට පැවරීමට හැකි ය.

එකී කමිටුවේ බලවරම යටතට අයත්වන නිලධාරී කාණ්ඩ කවරේදැයි නිශ්චය කරනු ඇත්තේ කැබිනට් මණ්ඩලයයි.

කොමිසමේ හෝ කමිටුවේ බලතල හෝ ක්‍රියාවන් පිළිබඳ ව විමර්ශනය කිරීමට හෝ ප්‍රශ්න කිරීමට කිසිඳු අධිකරණයකට හෝ විනිශ්චට සභාවකට නොහැකි ය.

වඩාත් වැඩි බලතල සහිත ඉහත කමිටුව හේතුවෙන් රාජ්‍ය සේවා කොමිසම නාමික ආයතනයක් පමණක් වනු ඇත. මෙය, රාජ්‍ය සේවය දේශපාලනීකරණයට මගපෑදීමට සහ රාජ්‍ය සේවකයින්ගේ සේවා තත්වයන් වඩාත් පහත හෙලීමට බොහෝ දුරකට ඉඩ සලසනු ඇත.

**රාජ්‍ය සේවකයින් සේවයේ යොදවන්නේ රජයෙන් වන අතර, රටේ විශාල ත ම සේවායෝජකයා වන්නේ රජයයි.**

**කෙසේ නමුත්, බලයට ආ විවිධ රජයන් රාජ්‍ය නිලධාරීන්ට බාධා කිරීමටත් ඔවුන්ගේ කටයුතුවලට ඇඟිලි ගැසීමටත් යොමු වී තිබේ.**

**ඔවුන් ට තම ධුරකාලයේ සුරක්ෂිතතාවක් සහ සේවයේ නියැලීම සඳහා සාධාරණ ඉඩප්‍රස්ථාවන් ලැබේවි ද?**

- **20A යටතේ ස්වාධීන කොමිෂන් සභා අවදානමේ**

    මානව හිමිකම් කොමිසමේ, මුදල් කොමිසමේ, සීමා නිර්ණ කොමිසමේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ, රාජ්‍ය භාෂා කොමිසමේ, විගණකාධිපති සහ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සාමාජිකයින් තවදුරටත් රාජ්‍ය නිලධාරීන් නොවනු ඇත.

ඔබ, වැදගත් කොමිෂන් සභා අතහැර දමනු ලැබීමත් තවත් කොමිෂන් බලරහිත කරනු ලැබීමත් පිළිබඳව සැලකිල්ල දක්වන පුරවැසියෙක් ද?

2016 හා 2018 අතර කාලය තුළ පුද්ගලයින් 15,963ක් සහන තකා ජාතික මානව හිමිකම් කොමිසම වෙත විවිධ අවස්ථාවල අභියාචනා කර තිබේ.

- **20A යටතේ ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාල විගණනය කිරීමට නියම වී නොමැත.**

    ටෙන්ඩර් මණ්ඩල සහ විගණන කොමිෂන් මගින් නාස්තිය, වංචාව සහ දූෂණය පාලනය කරයි.

    නාස්තිය, වංචාව සහ දූෂණය සඳහා ඇති ඉඩ, පුරවැසියකු වශයෙන් ඔබගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව කෙරෙහි බලපෑමට ඉඩ තිබේ.

    ඔබ මේ පිළිබඳ සැලකිලිමත් ද?

- **20A යටතේ ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට තේරී පත්විය හැකි අතර ජනාධිපතිවරයා බවට තේරී පත්වීමට පවා ඉඩ තිබේ.**

පුද්ගලයකු වෙනත් රටක පුරවැසියකු බවට පත්වන කළ, එරට ට පක්ෂපාතී වන බවට දිවුරන්නට සිදු වේ. ඇතැම් රටවල, ඔවුන් ට එකී රට වෙනුවෙන් අවි දැරීමට පවා සිදු වේ. ශ්‍රී ලංකාවට සහ තමන් පුරවැසිභාවය ලැබූ තවත් රටක ට බලපාන කරුණු සම්බන්ධයෙන් තීරණ ගන්නේ එවැනි පුද්ගලයින් විසින් නම්, ඔවුන් එහි දී වඩාත් පක්ෂපාති වනු ඇත්තේ කුමන රටකට ද? ඒ තැනැත්තා කෙරේ අප කෙසේ පූර්ණ විශ්වාසය තබන්න ද?

# ඔබේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගෙන් ඇසිය යුතු ප්‍රශ්න

## ඔබ 20වැනි සංශෝධනයට පක්ෂව ඡන්දය ලබාදීමට පෙර, ඔබ ට ඉදිරිපත් කිරීමට අපට ප්‍රශ්න 09 ක් තිබේ

පුරවැසියන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කරගන්නේ අපගේ ගැටළු හා ඉල්ලීම් පාර්ලිමේන්තුවේ නියෝජනය කිරීමටයි - ඔබලා අපගේ නියෝජිතයින්වීම අපට වුවමනා කර තිබේ.

**1. 20A මගින් පාර්ලිමේන්තුව පසෙකට තල්ලු වේ.**

ඡන්දදායකයකු වශයෙන් අපේ අපේක්ෂා තවදුරටත් නියෝජනය කිරීමට ඔබ ව අපොහොසත් කරවමින්, ඔබේ හඬ ඔබෙන් උදුරාගන්නා නීති සම්පාදනයට ඔබ සහය දෙනවා ද?

**2. 20A යටතේ සියලු බලතල ජනාධිපතිවරයා වෙත කේන්ද්‍රගත වේ.**

තනි පුද්ගලයකුට සියලුම වගකීම් සහ බලතල ලබාගන්නට ඉඩහැරීම ආරක්ෂා සහගත ද? ජනාධිපතිවරයා අසනීප වුවහොත් සිදුවන්නේ කුමක් ද? අප ඡන්දය ලබා නොදුන් තැනැත්තෙක් ඔහු වෙනුවෙන් එම ස්ථානයට පත්වීමට ඉඩ ඇති අතර, එවිට එම තැනැත්තාට මේ සියලු බලතල හිමිවනු ඇත.

**3. 20A මගින් විගණන කොමිසම සහ ප්‍රසම්පාදන කොමිසම අහෝසි කරනු ඇත.**

රටවැසියන්ගේ මුදල් වියදම් කරන අන්දම සම්බන්ධයෙන් රජය වගවිය යුතු නොවේ ද?

**4. 20A යටතේ වෙනත් කොමිසම් ද අහෝසිවීමට ඉඩ තිබේ**

ඉඩම් ගැටළු, උසස්වීම්, ප්‍රාදේශීය නිලධාරීන් විසින් සිදුකරන තාඩන පීඩන යනාදිය විසඳාගැනීම සඳහා අපට යා හැක්කේ කා වෙත ද? අධිකරණ ක්‍රියාදාමයට බොහෝ මුදල් හා කාලය වියදම් වේ. දුගී ජනයාට අධිකරණයට යාම දැරිය නොහැකි ය.

**5. ඔබට පක්ෂ ව ඡන්දය ලබාදුන් පුරවැසියන් කෙරෙහි ඔබට වගකීමක් ඇතැයි සිතෙන්නේ ද, නැතිනම් ඔබ සිතෙන්නේ ජනාධිපතිවරයා හා අගමැතිවරයා කෙරෙහි පමණ ද?**

**6. 2015 දී ඔබ 19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ට පක්ෂ ව ඡන්දය ලබාදෙමින් ජනාධිපතිවරයාගේ බලතල අඩුකිරීමටත් පාර්ලිමේන්තුව වඩාත් ස්වාධීන කිරීමටත් එකඟ විය. ඒ සියල්ල ම කණපිට පෙරලන 20 වැනි සංශෝධනය ට ඔබ එකඟ වන්නේ නම්, ඔබේ තීන්දු සහ ඔබ කෙරේ විශ්වාසය තැබීමට අපට හැකි ද?**

7. **රාජ්‍ය සේවය තවදුරටත් එතරම් වැදගත් වැදගත් බවක් නොපෙනේ. ඔබ ට අවශ්‍ය වන්නේ මෙය ද?**

8. **මෙම සංශෝධනය ගෙන එනු ලබන හදිසි සහ රහසිගත අන්දම පිළිබඳ ව අපගේ කැමැත්තක් නැත. මෙය කෙටුම්පත් කළේ කවුදැයි කිසිවකු අපට නොකියයි. අපගේ ආර්ථිකය ගොඩදැමීම, රැකියා නිර්මාණය කිරීම, විදෙස් රටවල සිර වී සිටින අපගේ ශ්‍රමිකයින් රැකබලාගැනීම වැනි දෑ කෙරෙහි අවධානය යොමු කළ යුතු ව ඇති අවස්ථාවක ඔබ මෙම සංශෝධන සමගින් කාලය නාස්ති කරන්නේ ද?**

9. **ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවේ අසුන්ගන්නට ඉඩ සැලසීම**

පුද්ගලයකු වෙනත් රටක පුරවැසියකු බවට පත්වන කළ, එරට ට පක්ෂපාතී වන බවට දිවුරන්නට සිදු වේ. ඇතැම් රටවල, ඔවුන් ට එකී රට වෙනුවෙන් අවි දැරීමට පවා සිදු වේ. ශ්‍රී ලංකාව ට සහ තමන් පුරවැසිභාවය ලැබූ තවත් රටක ට බලපාන කරුණු සම්බන්ධයෙන් තීරණ ගන්නේ එවැනි පුද්ගලයින් විසින් නම්, ඔවුන් එහි දී වඩාත් පක්ෂපාති වනු ඇත්තේ කුමන රටකට ද? ඒ තැනැත්තා කෙරේ අප කෙසේ පූර්ණ විශ්වාසය තබන්න ද?


**නීතිය හා සමාජභාරය**
**අංක 03, කින්සි ටෙරස්, කොළඹ 08, ශ්‍රී ලංකාව**
**දුරකතන + 94 (0) 112684845**
**ෆැක්ස් + 94 (0) 112686843**
**admin@lstlanka.org**
**www.lstlanka.org**


LAW & SOCIETY TRUST